**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 261- ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,157.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,151.92 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.08 ක් හෙවත් සියයට 0.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,079.00 | 1,074.73 | 4.27 | 0.40 |
| මූලධන | 78.00 | 77.19 | 0.81 | 1.04 |
| **එකතුව** | **1,157.00** | **1,151.92** | **5.08** | **0.44** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 3,271 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,040 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 231 ක් හෙවත් සියයට 7.06 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 60.00 | 59.98 | 52.00 | 58.55 | 225.00 | 204.94 |

## 2.3 අග්‍රිම ගිණුම්

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/0000/00/0308/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.19 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පහත සඳහන් පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 402.37 ක් විය.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0002/0094/000 | 4.94 |
| 6000/0000/00/0013/0062/000 | 29.44 |
| 6000/0000/00/0016/0045/000 | 309.07 |
| 6000/0000/00/0017/0015/000 | 58.92 |
| **එකතුව** | **402.37** |

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති බෝපේ පෝද්දල සහ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛන විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

**3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරිම**

------------------------------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇල්පිටිය මහජන ක්‍රීඩාංගණය නවීකරණය සඳහා පළාත් නැගුම වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී රු.30,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. අදියර 2 ක් යටතේ ඇස්තමේන්තු සකස් කිරීම අනුමත කිරීම හා වැඩ අධීක්ෂණය දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත පවරා තිබූ අතර සීමිත මිලගණන් කැඳවා තෝරාගත් කොන්ත්‍රාත්කරුවකු සමඟ අදියර 1 හා 2 සඳහා දින 50 කින් නිම කිරීමේ එකඟත්වය ඇතිව 2014 නොවැම්බර් 10 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2016 ඔක්තෝබර් මාසය වන විට කර්මාන්තයේ පළමු අදියර සඳහා රු.28,971 ක් ද දෙවන අදියර සඳහා රු.12,278,179 ක් ද ගෙවා තිබුණි. 2016 ඔක්තෝබර් 28 දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී එහි වැඩ අවසන් කර නොතිබුණු බව අනාවරණය විය.

- එම කොන්ත්‍රාත්තුව දින 50 කින් නිමකළ යුතුව තිබුණත්, එම කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රමාණ පත්‍රයෙහි මූලික වියදම් යටතේ කාර්මික නිලධාරියෙකු වෙනුවෙන් මාස 6 කට රු.150,000 ද, දෙවන අදියර සඳහා වැඩබිම් ඉංජිනේරුවරයකු වෙනුවෙන් මාස 09 කට රු. 315,000 ද ඇස්තමේන්තු කර තිබුණත්, වැඩ අධීක්ෂණය සඳහා එම නිලධාරීන් යොදවා නොතිබුණි.

- මිල ගණන් පිළිගැනීමේ ලිපියේ සඳහන් කරුණුවලට පටහැනිව කාර්යසාධන බැඳුම්කරය රක්ෂණ සමාගමක් විසින් ඉදිරිපත් කර තිබුණි.

- සපයන ලද පස් වල ගුණාත්මකභාවයට අදාළ පරීක්ෂණාගාර වාර්තාවක් රහිතව කොන්ත්‍රාත්කරු සැපයූ බවට ඉදිරිපත් කරන ලද පස් මුට්ට කරන ලද බවට වූ මිනුම් මත පදනම්ව පස් ඝන මීටර් 6450 ක් සඳහා රු.3,354,000 ක් ගෙවා තිබුණි.

- වැඩ විෂයය අංක B-3 යටතේ පස් තුනී කර තැලීම යන්ත්‍රානුසාරයෙන් සිදුකර, මිනිස් ශ්‍රමය මත පදනම්ව ගෙවීම් කිරීම නිසා රු.956,535 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- ඇස්තමේන්තුගත වැඩ විෂයයට අනුව ගංගා වැලි වෙනුවට මුහුදු වැලි භාවිතා කිරීම හේතුවෙන් රු.799,600 ක් වැඩි පුර ගෙවා තිබුණි.

- කාණුවේ පතුලට යෙදීමට සැලැසුම් කරන ලද මිලිමීටර් 150 ක වැලි තට්ටුව සඳහා මිලිමීටර් 50 ක වැලි තට්ටුවක් යෙදීම හේතුවෙන් රු.248,640 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- නියමිත ප්‍රමිතියට අනුව ජල ප්‍රවාහන කාණු පද්ධතිය ඉදිකර නොතිබුණි.

(ii) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුරුපැල්පොල මාර්ගය කොන්ක්‍රීට් කර අවසන් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට දිග මීටර් 107 ක් කොන්ක්‍රීට් කිරිම සඳහා රු.494,689 ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ ඉදිකිරීම් ආයතනයක් වෙත 2016 දෙසැම්බර් 12 දින කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි. ඇස්තමේන්තුව ප්‍රකාරව මාර්ගයේ කොන්ක්‍රීට් තට්ටුව අඟල් 5 ක ඝනකමට ඉදිකළ යුතු නමුත්, මාර්ගයේ ස්ථාන කිහිපයක ඝනකම අඟල් 4, 3 හා 2 මට්ටමේ පැවති අවස්ථා නිරීක්ෂණය විය. මාර්ගයේ ස්ථාන කිහිපයක කොන්ක්‍රීට් තට්ටුව ඉරිතලා තිබූ අතර, තවත් ස්ථාන තුනක කොන්ක්‍රීට් තට්ටුව කැඩී තිබුණි.

(iii) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වල්ලහගල පැපිලියාන පාර මීටර් 400 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,942,013 ක ගිවිසුම්ගත වටිනාකමක් යටතේ ගොවි සංවිධානයක් වෙත 2016 දෙසැම්බර් 08 දින කොන්ත්‍රාත් පවරා තිබුණි. මෙහි යොදා තිබූ කොන්ක්‍රීට් පෘෂ්ඨය නියමිත කොන්ක්‍රීට් මිශ්‍රණය අනුව යොදා නොතිබූ බැවින් මාර්ගයේ හරස් අතට ස්ථාන 07 කින් පුපුරා තිබුණි.

(iv) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උඩුවිල මැදවත්ත පාර මීටර 168.5 ක පෙරසවි ගල් ඇල්ලීම සඳහා රු.1,456,357 ක ගිවිසුම්ගත වටිනාකමක් යටතේ ගොවි සංවිධානයක් වෙත කොන්ත්‍රාත් පවරා වැඩ නිම කර තිබුණි. මෙහි ඇස්තමේන්තුව ප්‍රකාරව වැඩ විෂය අංක 04 යටතේ පෙරසවි ගල් ඇල්ලූ මාර්ගය දෙපස අඟල් 8 ක ගැඹුරකට හා අඟල් 6 ක පළලට කොන්ක්‍රීට් යෙදීම සිදුකළ යුතු වුවත්, දිග මීටර් 283 ක් තුළ අඟල් 5 ක ගැඹුරකට හා අඟල් 6 ක පළලට කොන්ක්‍රීට් යොදා තිබුණි. මේ අනුව ඇස්තමේන්තුවට පටහැනිව අඩුවෙන් වැඩ කර තිබූ කොටසටද සමඟ මුළු වැඩ විෂය සඳහාම වූ සම්පූර්ණ මුදල වන රු.162,766 ක් ගෙවා තිබුණි.

(v) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කරුවලදෙනිය කුඹුරුයාය මැදින් දිග මීටර් 970 ක නව ඇල මාර්ගයක් කැපීමේ ව්‍යාපෘතිය සඳහා රු.906,574 ක් වැයකර වැඩ නිමකර තිබුණද මෙහි කුඹුරුයාය මැදින් දිවෙන පාර හරහා බෝක්කුවක් ඉදි නොකිරීම තුළ, ඉදිකර තිබූ ඇලෙහි ජලය බැස ගොස් නොතිබූ අතර 2017 මාර්තු 08 දින වන විට එහි අඩියක් පමණ ප්‍රමාණයට මඩ පිරී ඇල මාර්ගය වල්බිහි වී ප්‍රයෝජනයට ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

(vi) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගිනිමැල්ලගහ වෙල්යායේ පොට්ටනියාය අමුණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් පළාත් නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ රු.500,000 ක් හා දකුණු පළාත් සභාවේ රුහුණු උදාන සංවර්ධන වැඩසටහන යටතේ රු.100,000 ක් වෙන්කර තිබුණි. වැඩ ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කාර සමිතියක් සමඟ 2014 නොවැම්බර් 03 හා දෙසැම්බර් 08 යන දිනයන්හි ගිවිසුම්ගත වී තිබුණි. 2014 වර්ෂය අවසන් වනවිට රු. 490,000 ක වියදමින් සිලින්ඩර දමා ඇනිකට් 08 ක් ඉදිකර තිබුණද, එහි ජල පාලක දොරටු නොදැමීම නිසා ඉතිරි වූ රු.100,000 ක මුදල් ආපසු යවා තිබුණි. ව්‍යාපෘතියෙහි එම කොටස නිම නොකිරීම නිසා නිමකළ වැඩ කොටසද ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව වර්ෂ 02කට අධික කාලයක් මුළුල්ලේ නිෂ්කාර්යව පැවතුණි.

**(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

2016 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම ප්‍රජා මූල බැංකු 3 ක් මගින් ප්‍රතිලාභීන් 302 ක් වෙත ලබා දී තිබූ එකතුව රු.8,283,587 ක ණය ශේෂය කල්පසු වූ ණය ලෙසත්, ප්‍රතිලාභීන් 90 දෙනකුට ලබාදී තිබූ එකතුව රු.1,147,054 ක ණය ශේෂය බොල් ණය ලෙසත් හඳුනාගෙන තිබූ අතර එය අයකර ගැනීම ගැටලුකාරී වී තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 02 ඉක්මවූ එකතුව රු. 158,033,225 ක් වූ තැන්පතු 296 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 26101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 976,745 ක ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගෙන නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ජීප් රථයක් සහ නිසාන් මෝටර් රථයක් ධාවනයෙන් ඉවත් කර 2016 දෙසැම්බර් 31 දින වනවිට පිළිවෙලින් මාස 07 ක් හා වර්ෂ 02 ක කාලයක් ගතවී තිබුණත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි .

(ii) 1999 වසරේදී ඉදිකර තිබූ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම්ගේ රජයේ නිවස විවෘත කර වර්ෂ 17 කට අධික කාලයක් ගතවී තිබුණද, එම කාලය ඇතුළත කිසිදු ප්‍රාදේශීය ලේකම්වරයකු එහි පදිංචි වී නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

---------------------------------------------------------

බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි අක්කර 01 රූඩ් 03 පර්චස් 21 ක් වූ භූමියෙහි හිමිකම් තහවුරු කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එකතුව රු.791,721 ක් වටිනා ව්‍යාපෘති 02 ක් හා හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එකතුව රු.2,785,000 ක් වූ ව්‍යාපෘති 06 ක වැඩ ආරම්භ නොකර අතහැර තිබුණි.

**3 .7 කාර්යසාධනය**

----------------

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

ඉඩම් අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ගම් පුළුල් කිරීමේ වැඩ සටහනට අදාලව ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමේ අරමුණින් නාගොඩ ප්‍රාදේශීය ලේකම් සහ දක්ෂිණ සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ වී නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 218C උක්ඹිවිට ග්‍රාමයේ පිහිටි අක්කර 467, රූඩ් 1 පර්චස් 26 ක් වූ ඇප්තොප්වත්ත ඉඩම අත්කර ගැනීමේ කටයුතු 1999 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 මැයි 21 දින අංක 1080/13 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය මගින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) අතුරු විධානය නිකුත් කර එම ඉඩම ප්‍රාදේශීය ලේකම් භාරයට ගෙන තිබුණි.

(ආ) 2016 වර්ෂය වන විට ඉන් අක්කර 61 පර්චස් 142 ක් ගම් පුළුල් කිරීම වැඩසටහන යටතේ බෙදා දී තිබූ අතර , අරමුණට පටහැනිව තවත් අක්කර 01 පර්චස් 58 ක් හෝටල් කර්මාන්තය සඳහා ලබා දී තිබුණි.

(ඇ) අක්කර 169 ක බිම් ප්‍රමාණයක් බෙදා දීමට නුසුදුසු ඉඩම් ලෙස හඳුනාගෙන ඇති අතර එම බිම් ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා මැනුම් ඉල්ලීමක් මිනින්දෝරු

දෙපාර්තමේන්තුව වෙත 2015 වර්ෂයේදී යවා තිබුණත්, එම කටයුතු 2017 ජුනි 22 දින වන විටත් ඉටු කර නොතිබුණි.

(ඈ) ඉඩම් අත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් 1999 ඔක්තෝබර් 19 දින රු.1,600,000 ක් ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. එම මුදල් ආයෝජනය කර ඉපයූ මුදලින් රු.1,856,714 ක් රජයේ ආදායමට බැර කර තිබුණද ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, රු.1,585,625 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) ඒ අනුව ගම් පුළුල් කිරීමේ අරමුණින් ඉඩම අත්කර ගෙන වර්ෂ 17 ක් ගතවී තිබුණත්, එම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට නොහැකි වී තිබූ අතර එම ඉඩම අනවසරකරුවන්ගේ ග්‍රහණයට නතුවී තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දින ආයතන 3 කින් රු.627,650 ක් වටිනා පරිගණක හා උපාංග මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් ආයතන 05 ක් වෙත 2016 දෙසැම්බර් 30 දින ලංසු කැඳවීම සඳහා ලිපි සකසා තිබූ අතර ලංසු එවිය යුතු අවසන් දිනය එදිනම විය. එදිනට එක් ආයතනයක් විසින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණත්, ප්‍රසම්පාදන කමිටුව විසින් එම ලංසුව පරීක්ෂා කිරීමේදී මිල ගණන් සඳහා කැඳවුම් ලිපි යවා නොතිබුණු වෙනත් ආයතන 03 කින් 2016 දෙසැම්බර් 30 දිනට පසුව ලද මිල ගණන් සඳහාද, 2016 දෙසැම්බර් 30 දිනය සඳහන් කර දින මුද්‍රාව තබා මිල ගණන් සසඳා තිබුණි. ඒ අනුව මිල කැඳවුම් ලැබූ ආයතනයකින් හා පසුව මිල ගණන් ලද ආයතන 02 කින් ඉහත මිලදී ගැනීම සිදුකර තිබූ අතර එම මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි විනිවිදභාවයකින් යුක්තව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ යෙදී සිටි නිලධාරියෙකු විසින් සිදු කර තිබුණු රු.815,650 ක චෙක්පත් වංචාව සම්බන්ධයෙන් අධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පැවතුණි. මේ නිසා චෙක්පත් වංචාව නිසා සිදු වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වාහනයකට 2001 ජුනි 26 දින සිදුවී තිබූ අනතුර සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පැවති නඩුවක තීන්දුව ප්‍රකාරව දෙවැනි විත්තිකාරිය ගෙන් අයකර ගත යුතු රු.130,168 ක අලාභය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

## 3.10 විසඳා නොතිබුණු විගණන ජේද

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ජේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් නිවැරදි කර නොතිබුණු ජේද වලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
| --- | --- | --- |
| **වර්ෂය** | **ජේද අංකය** | |
| 2014 | 3.3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පරිපාලන නිලධාරී නිවස වර්ෂ 05 කට වැඩි කාලයක සිට බාහිර පාර්ශවයක් විසින් පරිහරණය කර තිබූ අතර, රු. 76,200 ක් වූ හිඟ නිවාස කුලිය තවදුරටත් අයකර ගත යුතුව තිබුණි. |
| 2014 | 3.1 (අ) (ii) | මාර්ග කාපට් කිරීම සඳහා 2011 හා 2013 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු.139,333,203 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| 2015 | 3.2.2(ඇ)(i) | බටපොල දිසා රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2014 දෙසැම්බර් 22 දින කොන්ත්‍රාත්කරුට රු.1,363,328 ක් ද, 2014 දෙසැම්බර් 09 දින උපදේශන සේවා ගාස්තු ලෙස රු.60,929 ක් ද, 2014 දෙසැම්බර් 19 දින ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු දීමනා ලෙස රු. 16,250 ක් ද වැය කර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද, 2016 ජුලි 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි වැඩ ආරම්භ කර නොතිබුණු නමුත්, ගෙවන ලද අත්තිකාරම් මුදලද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| 2015 | 3.2.2(ඇ)(ii) | අම්බලන්ගොඩ කහටපිටිය ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2014 දෙසැම්බර් 29 දින කොන්ත්‍රාත්කරුට රු.1,253,676 ක් ද, 2014 දෙසැම්බර් 09 දින උපදේශන සේවා ගාස්තු ලෙස රු. 56,019 ක් ද, 2014 දෙසැම්බර් 19 දින ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටු දීමනා ලෙස රු.16,250 ක් ද වැය කර තිබුණි. 2016 ජුලි 31 දින වනවිට මෙහි ගිවිසුම් කාලය ඉකුත් වී තිබුණු අතර ඉහත ගෙවීම් සිදුකර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණත්, ව්‍යාපෘතියේ වැඩ සියයට 20 ක ප්‍රමාණයට හෝ නිමකර නොතිබුණි |

## 3.11 කළමනාකරණ දූර්වලතා

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් පරිදි කළමනාකරණ දූර්වලතා අනාවරණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2015 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් මගින් ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.6,000,000 ක් වූ මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 12 ක හා 2016 වර්ෂයේදී අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.1,277,556 ක් වූ ව්‍යාපෘති 03 ක පැවතිය යුතු සම්පීඩන ශක්තිය නියමිත සීමාවට වඩා අඩුවෙන් පැවති තිබුණි. එම ව්‍යාපෘති සාර්ථකව නිම නොකිරීම නිසා ඒවායේ අපේක්ෂිත ශක්තිය හා කල් පැවැත්ම පිළිබඳව ගැටලු මතුවී තිබුණි.

(ආ) යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නායයෑමට ලක්ව තිබූ නාකියාදෙණිය ගොඩහේන්කන්ද පදිංචි පවුල් සඳහා ඉඩම් ලබාදීමේ හා ඉඩම් නොමැති අය හට ඉඩම් ලබාදීමේ අරමුණින් නාකියාදෙනිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වටවල වැවිලි සමාගමට අයත් අක්කර 36 රූඩ් 02 ක ඉඩම අත්කර ගැනීමේ යෝජනාව 1997 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණි. ඉඩම මැනුම් කිරීම සම්බන්ධයෙන් වතු සමාගම සමඟ පැවති නඩුවෙහි තීන්දුව 2001 ඔක්තෝබර් 17 දින ලැබී තිබුණු අතර 2016 වර්ෂය වන විට තීන්දුව ලැබී වර්ෂ 15 ක් ගතවී තිබුණද, එම ඉඩම අත්කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ දෙකක පිහිටි එකතුව පර්චස් 83 ක් පමණ වූ රජයට අයත් ඉඩම් කැබලි 09 ක් පුද්ගලයින් 09 දෙනෙකු විසින් වර්ෂ 01 ක සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක් මුළුල්ලේ අනවසරයෙන් පරිහරණය කරමින් පැවතුණි.

(ඈ) කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිකර තිබූ සුනාමි නිවාස ගම්මාන 08හි නිවාස 370 ක් අවතැන් වූවන් සඳහා ලබාදී තිබූ අතර 2016 සැප්තැම්බර් 02 දින වන විට එම නිවාස අතරින් නිවාස 205 ක් සඳහා හිමිකම් නිරවුල් කර ඔප්පු ලබාදී නොතිබුණි.

(ඉ) බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාගාල්ල ජලසම්පාදන ව්‍යාපෘතියේ හපුගල ජල පවිත්‍රාගාරයට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් වුවද, ඒ සඳහා ලද ප්‍රතිපාදන වලින් රු.191,550ක් 2017 ජූලි මාසය වන විටත් පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. මැනුම් ගාස්තු ගෙවීම සඳහා රු.55.67 ක් හිඟවීම මත මෙම කටයුතු මෙලෙස ප්‍රමාද කරමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තිලක උදාගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි මු.පි.ගා 1715 දරන පිඹුරට අයත් අංක 13, 16 හා 15,18 දරන කැබලි වල කළුගල් කැඩීම සඳහා පුද්ගලයකු වෙත බදු පදනම යටතේ බලපත්‍ර 02 ක් ලබාදී තිබුණි. ඒ අතරින් කැබලි අංක 15, 18 දරන කැබලි සඳහා ලබාදී තිබූ බලපත්‍ර සීමාව ඉක්මවා කැබලි අංක 19 සහ 23 දරන කැබලිවල අනවසරයෙන් කළුගල් කැඩීම හේතුවෙන් බලපත්‍රය අවලංගු කර කඩා තිබූ කළුගල් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන රාජ්‍ය භාගය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බෝගහගොඩ නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් රු.2,850,000 ක් 2014 ඔක්තෝබර් 20 දින ඉමදූව ප්‍රාදේශීය සභාව විසින් ඉමදූව ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. 2017 අප්‍රේල් 04 දින වන විට මුදල් ලබාදී වර්ෂ 02 කට අධික කාලයක් ගතවී තිබුණත්, අත්පත් කර ගැනීම මූලික අදියරේ පැවති අතර ලැබූ මුදල් දිගුකාලයක් තිස්සේ ආයෝජනය නොකර රඳවාගෙන තිබුණි.

(ඌෟ) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 ජූලි 07 හා 2016 ජනවාරි 06 යන දිනයන්හි ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද පිළිවෙළින් අංක BD/GPS/130/9/14/MC (ii) හා MC (iii) දරන ලිපිවල උපදෙස් අනුව කටයුතු නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයෙන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තිය 1(අ) ශ්‍රේණියට පත්වීම් ලබා තිබූ සංවර්ධන නිලධාරීන් 05 දෙනකුගෙන් අයවිය යුතු යතුරු පැදි වටිනාකම වූ රු.698,920 ක් අයකර ගෙන නොතිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 62 | 03 | - |
| (ii) | තෘතීයික මට්ටම | 44 | 31 | 15 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 1,775 | 1,673 | 133 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 173 | 159 | 15 | 01 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 06 | - | 06 |
| | **එකතුව** | **2,057** | **1,931** | **166** | **40** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 ජූලි 14 දින වන විටත් කාර්ය මණ්ඩලයේ 40 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතියත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.